# සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය
# දවුලගල - හන්දෙස්ස
# තනතුරු පුරප්පාඩු දැන්වීම

සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01) තනතුරු නාමය : **සාමාන්‍යාධිකාරී I**

02) වැටුප් අංක : H.L.01:01(6/2022 චක්‍රලේඛය අනුව)

03) වැටුප් පරිමාණය : 36,000-720X10-1080X10-1440X10-68,400/-

04) වයස් සීමාව : 18-50 (දැනට සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු ස්ථිර සේවයින්ට ඉහත වයස් සීමාව බලපානු නොලැබේ.)

මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනාවන් ගෙවනු ලබන අතර, විශ්‍රාම වැටුපට ද ඔබගේ කැමැත්ත මත දායක විය හැකිය. වෙනත් දීමනාද ගෙවනු ලැබේ.

**05) සුදුසුකම්**

අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වානිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම (රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය / වානිජ / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වානිජ / කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වීම.

**හෝ**

ඇ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය / පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාළ විෂයයන් ඇතුළත් මාස 09 කට නොඅඩු ආධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම / පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අයදුම්කරු විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමග සියලුම සහතිකවල ඡායා පිටපත් සහ පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවකවරයාගේ සහතිකයද චරිත සහතික 02 ක් ද, අමුණා පහත ලිපිනයට 2023.01.12 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.සේවයේ නියුතු සමුපකාර සේවකයින් තම ආයතන ප්‍රධානියා හරහා අයදුම්පත්‍රය එවිය යුතුය. අසම්පූර්ණ සහ උපදෙස්වලට පටහැනිව එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය,**

**ගරු සභාපතිතුමා,**
**සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය,**
**දවුලගල, හන්දෙස්ස.**

**මෙයට - සමුපකාරික**

**ගරු සභාපති**

**දිනය 2022/12/19**

**දු.අ. 081-2315402**